---------------------------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ, 1981 අංක 54 දරන ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, නියෝජිතායතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, නියෝජිතායතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය නියෝජිතායතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා නියෝජිතායතනය අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

නියෝජිතායතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, නියෝජිතායතනය වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙසමා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිත උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයකරන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් නියෝජිතායතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.
  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

  - තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නියෝජිතායතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ නියෝජිතායතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නියෝජිතායතනය ක්‍රියාකර ඇති බව,

- සියබලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 2හි 29 වගන්තිය ප්‍රකාරව සෘජු ක්‍රමයට මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදී සාමාන්‍ය ක්‍රියාකාරකම්වලින් ජනනය වූ අතිරික්තය සමඟ මෙහෙයුම් ක්‍රියාකාරකම්වල ශුද්ධ මුදල් ප්‍රවාහය සැසඳිය යුතු අතර එය මුදල් ප්‍රවාහයේ කොටසක් ලෙස හෝ මූල්‍ය ප්‍රකාශනවල සටහනක් වශයෙන් පෙන්විය යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී දක්වා ඇති අඩුපාඩුව නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ප්‍රමිතියේ වගන්තිය ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ අවශ්‍ය හෙළිදරව් කිරීම් කළ යුතුය. |
| (ආ) 2023 වර්ෂයේ ආරම්භ කළ හා 2023 වර්ෂය ආවරණය වන මුළු වටිනාකම රු.63,699,742 ක්වූ පර්යේෂණ ව්‍යාපෘති 05 කට අදාළ උපදේශන සේවා ආදායම ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 10 හි 20 වගන්තිය ප්‍රකාරව ව්‍යාපෘතියේ සමාප්ති තත්ත්වය සැලකිල්ලට ගෙන ව්‍යාපෘති ආදායම් වශයෙන් ගිණුම්ගත නොකර එම ව්‍යාපෘතිවල සමාලෝචිත වර්ෂයේ වියදමට සමාන රු.11,731,747 ක නාමමාත්‍රික උපදේශන ආදායමක් ගිණුම්වල හඳුනාගෙන තිබුණි. | පුරස්කාරය ලැබීම හා ව්‍යාපෘති ආදායම ලැබීම සම්බන්ධයෙන් වන ගිණුම්කරණ ප්‍රමිතය ගැලපීම සම්බන්ධයෙන් තව දුරටත් උපදෙස් ලබා ගැනීම සඳහා වරලත් ගණකාධිකාරී ආයතනයේ ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත සමාලෝචන කමිටුව වෙත ඉදිරිපත් කිරීමටත්, එමඟින් අප දැනට සිදු කරනු ලබන ගැලපීමේ යම් වෙනසක් සිදුකල යුතු වේනම් ඒ සම්බන්ධයෙන් ද ඉදිරි කටයුතු සිදු කරන අතර, මේ වන විට පෙර ලබා දෙන ලද උපදෙස් ප්‍රකාරව සත්‍ය වියදම පාදක කරගෙන සිදුකරනු ලබන ගැලපීම නිවැරදි වේ. | ප්‍රමිතයේ වගන්තිය ප්‍රකාරව අවශ්‍ය කටයුතු සිදුකළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දේපළ, පිරියත හා උපකරණ මිලදී ගැනීම් ලෙස රු.3,626,362ක් දක්වා තිබුණද, සත්‍ය මිලදී ගැනීම් වටිනාකම රු.9,197,117ක්වූ බැවින් ආයෝජන ක්‍රියාකාරකම් රු.5,570,755ක් අඩුවෙන් දක්වා තිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී සිදුවූ ගිණුම්කරණ දෝෂයක් ලෙස පිළිගන්නා අතර 2024 මූල්‍ය ප්‍රකාශන තුල සංසන්දනාත්මක තොරතුරු ඉදිරිපත් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | නිවැරදිව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කළ යුතුය. |
| (ආ) පසුගිය වර්ෂ වලට අදාළ රු.1,112,652 ක්වූ පර්යේෂණ දීමනාව සමාලෝචිත වර්ෂයේ වැටුප් හා වේතන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණු. බැවින් එම වටිනාකමින් සමාලෝචිත වර්ෂයේ ලාභය අඩුවෙන් හා රඳවාගත් ඉපයීම් වැඩියෙන් දක්වා තිබුණි. | පර්යේෂණ දීමනාව ගෙවීම් කිරීමේ දී මේ දක්වා අනුගමනය කරන ලද්දේ අනුමැතිය ලද පසු එකවර ගෙවීමක් ලෙස පවත්නා වර්ෂයට අදාළව ගිණුම් ගත කිරීමයි. විගණන නිරීක්ෂණය පිළිගන්නා අතර ඉදිරියේදී දක්වා ඇති පරිදි ගැලපීමට කටයුතු කරනු ලැබේ. | ඉකුත් වර්ෂවල වියදම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) 2021 දෙසැම්බර් 23 සිට 2023 ජුනි මස 21 දින දක්වා කාලයට අදාළව නොගෙවන ලද රු.1,717,276 ක්වූ පර්යේෂණ දීමනාව මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කර නොතිබීමෙන් සමාලෝචිත වර්ෂයේ ගෙවිය යුතු වියදම් රු.1,717,276 ක් අඩුවෙන් ද වර්ෂයේ ලාභය රු.565,677ක් හා රඳවාගත් ඉපැයීම් රු.1,151,599 ක් වැඩියෙන්ද දක්වා තිබුණි. | පර්යේෂණ දීමනාව සඳහා ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව විසින් අනුමැතිය ලබාදෙනු ලබන්නේ අදාල ගිණුම් වර්ෂයට පෙර වර්ෂවලට අදාළ දීමනා සඳහා වේ. එවිට අදාළ නිලධාරීන්ට ගෙවනු ලබන පර්යේෂණ දීමනාව ගිණුම්ගත කරනුයේ අදාළ ගෙවීම සිදුකරන මුදල් වර්ෂයේ වියදමක් ලෙසයි. | මූල්‍ය ප්‍රකාශන තුල පර්යේෂණ දීමනාව ගිණුම්ගත කිරීම නිවැරදිව සිදු කළ යුතුය. |
| (ඈ) සමුද්‍රිය අභිජනනාගාර මධ්‍යස්ථානය ඉදිකිරීම වෙනුවෙන් ගෙවූ අත්තිකාරම් මුදලින් අයකර නොගත් රු.2,432,290 මුදල අත්තිකාරම් ලෙස ගිණුම්ගත නොකර කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් ජංගම වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන්ද ජංගම නොවන වත්කම් එම ප්‍රමාණයෙන් වැඩියෙන්ද දැක්වුණි. | මෙහි 2023 දෙසැම්බර් මස 31 දිනට අත්තිකාරම් ගිණුමේ පෙන්විය යුතු ශේෂය රු1,260,582.11 කි. අනිකුත් මුදල කෙරීගෙන යන වැඩ තුල නිරූපණය කිරීම නිවැරදිය. | ප්‍රාග්ධන ඉදිකිරීම් වෙනුවෙන් කරන ලද අත්තිකාරම් මුදල් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) පනාපිටිය ප්‍රාදේශීය පර්යේෂණ මධ්‍යස්ථානයේ රු.1,443,758 ක්වූ | 2023 වසරේදි පනාපිටිය ප්‍රාදේශීය පර්යේෂණ | වර්ෂයේ ආදායම |

| | | |
|---|---|---|
| මත්ස්‍ය ආහාර සහ මත්ස්‍ය විකුණුම් ආදායම සමාලෝචිත වර්ෂයේ ආදායම් ලැබීම් යටතේ ගිණුම්ගත නොකර D 5503 ව්‍යාපෘතිය යටතේ ගිණුම්ගත කර තිබුණි. එම ගිණුමෙන් රු.514,849 ක් වූ වර්ෂයේ වියදම් ගැලපීම් කිරීමෙන් පසු රු.535,547 ක ආරම්භක ශේෂය ද ඇතුළුව රු.1,464,456 ක ශේෂය ව්‍යාපෘති ණයහිමියන් ලෙස ගිණුම්ගත කර තිබුණි. ඒ හේතුවෙන් වර්ෂයේ ලාභය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අනෙකුත් මෙහෙයුම් ක්‍රියාකාරකම් මඟින් ජනනය වූ මුදල් ප්‍රවාහය රු.928,909 ක් අඩුවෙන් දැක්වුණි. | මධ්‍යස්ථානයේ මත්ස්‍ය නිෂ්පාදන සඳහා අවශ්‍ය තරම් ප්‍රතිපාදන නොතිබීම හේතුවෙන් අඛණ්ඩව මත්ස්‍ය ආහාර සකස් කිරීම් කටයුතු කරගෙන යාම සඳහා ලැබෙන ආදායම උපයෝගී කර ගන්නා ලද අතර, එම මුදල් නැවත නැවත භාවිතයට ගැනීම සඳහා වෙනම අරමුදලක් ලෙස පවත්වාගෙන යාමට කටයුතු කරන ලදී. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) සමාලෝචිත වර්ෂයේ පෞද්ගලික නැව් සමාගමක ජාත්‍යන්තර නෞකාවක් වෙනුවෙන් පිළියෙල කරනු ලැබූ නාවික සිතියම් සඳහා සමාලෝචිත වර්ෂයේදී ලැබූ රු.2,080,000 ක මුදල මූල්‍ය ප්‍රකාශන තුල ආදායම් යටතේ ගිණුම්ගත නොකර ව්‍යාපෘති ණයහිමියන් යටතේ ගිණුම් ගත කර තිබුණි. | ජල ශාස්ත්‍රීය අංශය විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු මත ආරම්භයේදි මෙහි ණය හිමියෙක් ජනිත වන බැවින් හා අදාල කාර්ය අවසන් වූ බව වාර්තා නොවීම මත ණය හිමියෙක් වශයෙන් ගිණුම් ගත කර ඇත. | වර්ෂයේ ආදායම නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

### 1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂයය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| රු.83,675,867ක් වූ අත්තිකාරම් පියවීම්, උපචිත වියදම්, වැරදි නිවැරදි කිරීම් ජ'නල් වවුචර් 65 කට අදාළව කිසිදු මූලාශ්‍ර ලේඛණයක් ඉදිරිපත් නොවූයෙන් එම ජ'නල් වවුචර්වල නිවැරදිතාවය තහවුරු කර ගැනීමට නොහැකි විය. | 83,675,867 | ජ'නල් වවුචර් 65 කට අදාළ මූලාශ්‍ර ලේඛණ | මෙහිදී අඩුපාඩුවක් සිදුව ඇති අතර එය ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කරනු ලැබේ. | ශේෂවල නිවැරදිතාවය තහවුරු කර ගැනීමට අදාළව සනාථන ලේඛණ විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රීලංකා ප්‍රජාතාන්ත්‍රික | මුදල් රෙගුලාසි 395 ප්‍රකාරව ඊළඟ මාසයේ | ප්‍රාදේශිය කාර්යාල වෙනුවෙන් බැංකු සැසඳුම් සැකසීමක් සිදුව | මුදල් රෙගුලාසි 395 ප්‍රකාරව කටයුතු |

| | | | |
|---|---|---|---|
| සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 395 | 15 දිනට පෙර බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර ගෙවන නිලධාරියා විසින් සහතික කර විගණකාධිපති වෙත පරීක්ෂා කිරීමට සූදානම්ව තිබිය යුතු වුවද, ප්‍රාදේශීය කාර්යාල වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන ගිණුම් තුනක එලෙස කටයුතු කර නොතිබුණි. | නොමැත. මේ සම්බන්ධයෙන් අවදානය යොමු කර 133 වන විගණන හා කළමණාකරන කමිටුව විසින් මේ සම්බන්ධයෙන් කටයුතු කරන ලෙද දන්වා ඇත. සැකසීම් සිදුකරමින් පවතී. | කළ යුතුය. |
| (ආ) 2017 නොවැම්බර් 22 දිනැති අංක 17/2512/725/037 දරන අමාත්‍ය මණ්ඩල තීරණ | 2006 වර්ෂයේසිට 2015 ඔක්තෝම්බර් මාසය දක්වා වූ රු. මිලියන 39.93 ක හිඟ සේවක අර්ථසාධක අරමුදල් දායකය වර්ෂ 2 ක් තුළදී සිය ඉපැයීම්වලින් ආපසු පියවීමට අමාත්‍ය මණ්ඩල තීරණයෙන් උපදෙස් ලබාදී තිබූ අතර සමාලෝචිත වර්ෂයේ රු.36,389,679 ක්වූ ස්ථාවර තැන්පත් පොලී ආදායම් ලැබී තිබුණද රු.17,237,045 ක්වූ ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදල් දායකය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව මෙම මුදල නිරවුල් කිරීමට ප්‍රමාණවත් මුදලක් 2018, 2019 වර්ෂයන්හී ආයතනය සතුව නොපැවතුනි. 2019, 2021 කාලයේ පැවති කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් ආර්ථික අවපාතය දැඩිව පැවති අතර ඒ නිසා මෙම තත්වයට පත්වී තිබුණි. පසුව මේ සම්බන්ධයෙන් අවධානය යොමුකරන ලද පාලක මණ්ඩලය විසින් මෙම මුදල නිරාකරණය කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලද අතර වසර 03ක් තුල නිරවුල් කිරීමට වැඩ පිළිවෙලක් සකසන ලදී. මේ තත්වය ඉදිරියේදී අමාත්‍ය මණ්ඩලය දැනුවත් කිරීමට කටයුතු කරනු ලැබේ. | අමාත්‍ය මණ්ඩල තීරණ වලට අනුගත විය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.50,541,096 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.38,087,808 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.12,453,288 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට වෙනත් ආදායම් රු.46,585,939 කින් හා රාජ්‍ය ප්‍රදාන රු.13,896,759 කින් වැඩි වීමත් පුද්ගලික පඩිනඩි වියදම රු.34,148,925 කින් හා පර්යේෂණ හා සංවර්ධන වියදම රු.12,238,853 කින් අඩුවීමත් බලපා තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන තුළ ජංගම වත්කම් යටතේ වෙළඳ හා අනෙකුත් ලැබීම් ලෙස රු.29,636,894 ක්වූ ශේෂ අතරින් වසර 05ක් ඉක්මවූ රු.3,083,897 ක්වූ අත්තිකාරම්, වෙනත් ණයගැතියන් හා සේවක ණය අයකර ගැනීම අවිනිශ්චිත තත්ත්වයේ පැවතුණි. | අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. | ලැබියයුතු ශේෂ නොපමාව අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) රු.16,868,610 ක තක්සේරු වටිනාකමක් සහිත මත්ස්‍ය ආහාර නිපදවීමේ යන්ත්‍රය 2016 මාර්තු 15 දින පෞද්ගලික ආයතනයක් වෙත බදු දී 2021 වර්ෂයේදී යන්ත්‍රය නැවත නියෝජිතායතනය වෙත පවරාගෙන තිබුණි. 2020 ජූනි 05 දින සිට මාස 31 ක් දක්වා කාල සීමාවට අදාළ රු.4,650,000 ක්වූ හිඟ බදු මුදල් එම ආයතනය වෙතින් අයකරගෙන නොතිබුණි. නැවත 2023 මැයි මාසයේ වෙනත් පෞද්ගලික ආයතනයක් වෙත මෙම යන්ත්‍රය බදු දී තිබුණු අතර එම බදු ගිවිසුම විගණනයට ඉදිරිපත් නොවූ අතර එම බදු ගැනුම්කරු විසින්ද යන්ත්‍රයේ දෝෂ වර්තා කර එහි මාසික බදු මුදල් නොගෙවා තිබුණි. එසේ වූවද කළමනාකරණය විසින් මෙම යන්ත්‍රයට අදාළ ගිවිසුම අවසන් කිරීම හෝ ගිවිසුම් ප්‍රකාරව වාරික මුදල් අයකර ගැනීම පිළිබඳ, කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | 133 වන විගණන හා කළමනාකරණ කමිටුවේදී අවධානයට ලක් වන ලද අතර මෙහිදී නිර්දේශ කරන ලද්දේ මෙම යන්ත්‍රය තවදුරටත් පවත්වාගෙන යාම ප්‍රායෝගික නොවේ නම් සුදුසු ක්‍රමවේදයක් භාවිතා කර ඉවත් කිරීමටය. | මෙම යන්ත්‍රයට අදාළ ගිවිසුම අවසන් කිරීම හෝ ගිවිසුම් ප්‍රකාරව වාරික මුදල් අයකර ගැනීම පිළිබඳ, ක්‍රියාමාර්ගයක් ගත යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2021 වර්ෂයේ ආරම්භ කර තිබූ ජලජ සම්පත් ආශ්‍රිත කෙටි ආහාර විශේෂයක් සහ කරවල ආශ්‍රිත නිෂ්පාදන ක්‍රමවේද හඳුන්වා දීම පිළිබඳ පර්යේෂණ ව්‍යාපෘතිය සඳහා 2021 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා රු.1,590,592 ක් වියදම් කර තිබුණ අතර එම ව්‍යාපෘතිය ආරම්භ කර විගණිත දින | එකඟ වේ. | ව්‍යාපෘති අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට ක්‍රියාකළ යුතුය. |

| | | |
|---|---|---|
| වන විට වසර 3ක් ගෙවුණ ද එහි කටයුතු නිම වී නොතිබුණි. ඒ හේතුවෙන් එම පර්යේෂණ ව්‍යාපෘතියේ මූලික අරමුණක් වන මත්ස්‍ය ප්‍රෝටීන සහිත ජලජ සම්පත් කෙටි ආහාර විශේෂයක් නිෂ්පාදනය හා හඳුන්වා දීමේ අරමුණු ඉටුවී නොතිබුණි. | | |
| (ආ)සමුද්‍රිකා යාත්‍රාව පර්යේෂණ හා මැනුම් කටයුතු සඳහා භාවිතා කරනු ලබන අතර ආයතනය විසින් එම අපේක්ෂිත අරමුණු හා ඉලක්ක ලඟාකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර යාත්‍රාවේ අලුත්වැඩියා හා නඩත්තු කටයුතු වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ රු.37,816,050 ක් වැය කර තිබුණි. 2023 පෙබරවාරි මස සිට නාවික හමුදාව සමඟ පැවති අවබෝධතා ගිවිසුම අවසන්ව තිබූ නිසා යාත්‍රාවේ මෙහෙයුම් කටයුතුද නතර කර දැමීමට සිදුවී තිබුණි. | මේ වනවිට යාත්‍රාව මෙහෙයවීම සඳහා සුදුසු සේවා සපයන්නකු සොයා ගැනීම සඳහා කළමනාකාරීත්වය අදාල ආයතන සමඟ සාකච්ඡා සිදුකරමින් පවතී. | යාත්‍රාව පර්යේෂණ හා මැනුම් කටයුතු සඳහා යොදා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ)1996 අංක 32 දරන නාරා සංශෝධන පනත මඟින් ජලමාන විද්‍යාත්මක දත්ත එක්රැස් කිරීම හා අදාළ සිතියම්කරණ කටයුතු (National Charting Program) නියෝජිතායතනයේ මූලික කාර්යයක් ලෙස දක්වා ඇති අතර ඒ සඳහා රු.1,995,152 ක් වියදම් කර තිබුණි. මෙහිදී කොළඹ සිට මීගමුව දක්වාත් කොළඹ සිට වැලිගම දක්වාත් සිදු කිරීමට නියමිතව තිබූ ජලමාන විද්‍යාත්මක දත්ත මත පදනම් වූ සිතියම් වැඩසටහන්වල දත්ත එක්රැස් කිරීම් කටයුතු පමණක් සිදුකර තිබුණු අතර සියයට 50ක භෞතික ප්‍රගතියක් පමණක් ලබා කරගෙන තිබුණි. | වර්ෂය සඳහා ජාතික සිතියම් ව්‍යාපෘතියේ නාවික සිතියම සඳහා වූ දත්ත රැස්කිරීම සඳහා අතිශයින් දැවැන්ත මුදල් ප්‍රමාණයක් අවශ්‍ය වන අතර පවතින ආර්ථික අර්බුදය හමුවේ මෙම ජාතික සිතියම් ව්‍යාපෘතිය සඳහා වෙන් වූයේ රුපියල් මිලියන දෙකක් තරම් වූ මුදල් ප්‍රමාණයකි. වෙන්වූ ප්‍රතිපාදන තුළ ක්ෂේත්‍ර කටයුතු විශේෂයෙන්ම මෙම නාවික සිතියම්වලට අදාල ගොඩබිම් මැනුම් කටයුතු ආදියේ මැනුම් කටයුතු අවසන් කර ඇති අතර එම සිතියම් ආවරණය වන ප්‍රදේශවල ජලශාස්ත්‍රීය දත්ත සකස්කර ඇත. වෙන්වූ ප්‍රතිපාදන තුළ උපරිම අයුරින් ක්ෂේත්‍ර මැනුම් කටයුතු සිදුකර ඇති අතර දක්වා ඇති ක්‍රියාකාරකම් සඳහා මුදල් යෙදවීමට සිදුවිය. | නියෝජිතායතනයේ මූලික කාර්යයන් ඉටුවන අයුරින් සැලසුම් සකස් කළ යුතුය. |

**3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)පසු අස්වනු තාක්ෂණ අංශයේ (Analytical Chemistry Laboratory) පරීක්ෂණ කටයුතු සඳහා භාවිතා කරනු ලබන | Histamine පරීක්ෂාව සඳහා යොදා ගන්නා HPLC (High Performance Liquid Chromatography) | රසායනාගාර උපකරණ |

| | | |
|---|---|---|
| රසායනාගාර උපකරණ 04 ක් වර්ෂයේ කිසිදු සාම්පල් පරීක්ෂාවක් සඳහා උපයෝගී කරගෙන නොතිබූ අතර තවත් උපකරණ දෙකකින් සාම්පල් 58 ක පමණක් පරීක්ෂණ සිදුකර තිබුණි. ඒ අනුව රු.27,536,564 ක්වූ රසායනාගාර උපකරණ 04 ක සහ වටිනාකම හඳුනාගත නොහැකි වූ උපකරණ දෙකක නිසි කාර්යක්ෂමතා මට්ටමක් ලඟාකර ගැනීමට නොහැකිවී තිබුණි. | උපකරණය මගින් 2023 වර්ෂයට අදාළව රසායනාගාරයට ලැබුණු සාම්පල ප්‍රමාණය විශ්ලේෂණය කර ඇත. Bomb Calorimeter සන්නාම නාමය සහිත උපකරණය දැනට නිෂ්පාදනය සිදු නොකරන නිසා අලුත්වැඩියා කළ නොහැකි බවට සේවා සපයන්නන් නිර්දේශ කර ඇති බැවින් මෙම උපකරණය අබලි භාණ්ඩයක් ලෙස ගබඩාවට යොමු කිරීමට කටයුතු සිදු කෙරෙමින් පවතී. ඉතිරි උපකරණ සඳහා ඉල්ලුම් කරන ලද අලුත්වැඩියාව හා පුහුණුව ලබා ගත හැකි වනු ඇතැයි අපේක්ෂා කෙරේ. | කාර්යක්ෂමතා මට්ටමට පත්කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ)කල්පිටිය කුඩාව ප්‍රදේශයේ බහු විශේෂ මත්ස්‍ය අභිජනනාගාර සංකීර්ණයක් ඉදි කිරීම සඳහා අක්කර 03 ක ඉඩමක 2022 පෙබරවාරි 16 දින සිට අවුරුදු 30ක කාලයකට බදු ගෙන තිබුණද අයිතිය පවරා ගැනීමට පෙර එනම් 2020 වර්ෂයේදී එම ඉඩමේ සංවර්ධන කටයුතු සඳහා රු.1,631,963 ක වියදමක් දරා තිබුණි. මෙම ඉඩම අදාළ අරමුණු සඳහා යොදා නොගෙන මේ දක්වා ඌන උපයෝජිතව පැවතුණි. | මෙම ඉඩමේ අයිතිය අප වෙත පවරා දෙන ලෙස සිදුකරන ලද ඉල්ලීමට අනුව එය දීර්ඝ කාලීන බදුපදනම මත ලබාදීමට එකඟතාවය ලබා දුන් අතර ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදුකරන ලදී. ඒ අනුව ඉඩම දීර්ඝ කාලීන බදුපදනම් මත පැවරීමට වඩා අප අමාත්‍යාංශය හරහා දීමනා පත්‍රයක් මගින් පවරා ගැනීම සුදුසු බව නිරීක්ෂණය වීම මත මෙම මධ්‍යස්ථානය පිහිටි ඉඩම අමාත්‍ය මණ්ඩල අනුමැතිය සහිතව විශේෂ දිමනා පත්‍රයක් මගින් ධීවර අමාත්‍යාංශ හා පවරා දීමට කටයුතු කරන ලෙස 2023/05/26 දින ලිපියෙන් ඉල්ලීම් කර ඇත. ඒ අනුව කටයුතු සිදුකරමින් පවතී. | ඌන උපයෝජිත වත්කම් උපයෝජිත තත්වයට පත්කර ගත යුතුය. |
| (ඇ)2011 වර්ෂයේ රු. මිලියන 12ක් වැයකර නිපදවන ලද "තරණි" යාත්‍රාව තාක්ෂණික දෝෂ හේතුවෙන් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන වර්ෂ 10කට අධික කාලයක සිට නිශ්කාර්යව පැවතුණි. | පර්යේෂණ කටයුතු නව නිපයුමක් ලෙස අත්හදා බැලීම සඳහා නිපදවන ලද යාත්‍රාවකි. මේ වන විට මෙම යාත්‍රාව අධ්‍යයන කටයුතු සඳහා භාවිතා කිරීමට හැකිවන පරිදි සැකසීමට ආයතනයේ අධ්‍යක්ෂ සේවා මෙහෙයුම් වෙත පවරා ඇත. අදාල කටයුතු සිදුකරමින් පවතී. | සුදුසු පර්යේෂණ කටයුත්තක් සඳහා යොදාගත යුතුය. |
| (ඈ)රු. 7,512,800 ක වටිනාකමක් සහිත බෙල්ලන් ආකෘති 9391ක තොගයක් වසර ගණනාවක සිට ප්‍රයෝජනයට නොගෙන නිශ්කාර්යව පැවතුණි. | මෙම බෙල්ලන් ආකෘති තොගය කොරියානු ආයෝජකයෙකු විසින් නාරා ආයතනය සමග කරන ලද පර්යේෂණ සඳහා භාවිතා කර නැවත රැගෙන යාමකින් තොරව ආයතනය වෙත ලබා ඇති තොගයකි.මෙ සම්බන්ධයෙන් විගණන විමසුම් | සුදුසු පර්යේෂණ කටයුත්තක් සඳහා යොදාගත යුතුය. |

| | | |
|---|---|---|
| | කෙරෙහි අවදානය යොමු කරන ලද අතර ඉදිරි වසරේදී මේ සම්බන්ධයෙන් නව පරීක්ෂණ කටයුතු සිදුකිරීමට කටයුතු සිදුකරමින් පවතී. | |

**3.4 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නියෝජිතායතනයේ 2023 දෙසැම්බර් 31 දිනට කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් අනුමත කර තිබුණු කාර්යය මණ්ඩල විස්තර අනුව ඉහළ කළමනාකරණ මට්ටමේ ජ්‍යෙෂ්ඨ තනතුරු 03 ක් හා තෘතික විද්‍යාඥ තනතුරු 50 ක්ද කළමනාකරණ මට්ටමේ තෘතික තනතුරු 09 ක්ද කණිෂ්ඨ කළමනාකරණ මට්ටමේ ද්විතික මට්ටමේ තනතුරු 12 ක් සහ කළමනාකරණ සේවා පර්යේෂණ සහකාර තනතුරු 36 ක් ඇතුළුව ද්විතික මට්ටමේ තනතුරු 87 ක් සහ ප්‍රාථමික මට්ටමේ කම්කරු තනතුරු 57 ක් පුරප්පාඩුව පැවතුණි. ඒ හේතුවෙන් පර්යේෂණ තාක්ෂණ අංශයේ තනතුරු බහුතරයක් පුරප්පාඩුව පැවතීම පර්යේෂණ ව්‍යාපෘති කාර්යසාධනයට සෘජුව බලපෑ හැකි බව විගණනයට නිරීක්ෂණය විය. | නාරා ආයතනයේ පුරප්පාඩු පිරවීම සඳහා 2022 සහ 2023 වර්ෂවලදී ධීවර අමාත්‍යාංශය හරහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ඉල්ලා ඇත. නමුත් එම වර්ෂ වලදී ඒ සඳහා අනුමැතිය ලබා දී නොමැති බැවින් බඳවා ගැනීම සිදුකර නොමැත. | අදාළ අංශයන් හා කාර්යසාධනයට අවශ්‍ය කාර්යය මණ්ඩල අනුයුක්ත කළයුතුය. |